# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2118/41 - 2019 අප්‍රේල් මස 09 වැනි අඟහරුවාදා - 2019.04.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 03 දරන කෘෂිකර්ම ප්‍රඥප්තිය

දකුණු පළාත් සභාව විසින් 2019 මාර්තු මස 26 වැනි දින අනුමත කරන ලදුව දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2019 අප්‍රේල් මස 01 වැනි දින අනුමත කළ දකුණු පළාතේ 2019 අංක 03 දරන කෘෂිකර්ම ප්‍රඥප්තිය ආණ්ඩුකාර අනුමැතිය ලද 2019 අප්‍රේල් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන බව දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජලසම්පාදන හා ජලාපවහන, ආහාර හා සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන පිළිබඳ අමාත්‍ය උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක වන මම මෙයින් දැනුම් දෙමි.

උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක,
දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග,
ජලසම්පාදන හා ජලාපවහන, ආහාර හා සැපයුම් හා බෙදාහැරීම්,
වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2019 අප්‍රේල් මස 01 වැනි දින,
4 මහල, දක්ෂිණපාය, ලබුදුව,
ගාල්ල,
දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍ය කාර්යාලයේ දී ය.


1A - PG 4474 — 20 (2019/04)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 03 දරන කෘෂිකර්ම ප්‍රඥප්තිය

දකුණු පළාතේ ගොවි ජනතාවගේ යහපත උදෙසා කෘෂිකාර්මික හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නගා සිටුවීම අරමුණු කර ගනිමින් දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවක් පිහිටුවීම, කෘෂිකාර්මික කටයුතුවල යෙදී සිටින ප්‍රජාවගෙන් සමන්විත ස්වේච්ඡා කමිටු පිහිටුවීම, එම කමිටුවල බලතල තීරණය කිරීම සහ ඊට අනුශාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය (441 වන අධිකාරය වූ) කෘෂිකර්ම ආඥාපනතට අනනුකූල වේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය 2019 අංක 03 දරන දකුණු පළාත් කෘෂිකර්ම ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය දකුණු පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

### I කොටස

### දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම.

2. දකුණු පළාතේ ගොවි ජනතාවගේ යහපත උදෙසා කෘෂිකාර්මික හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නගා සිටුවීම අරමුණු කර ගනිමින් (මෙහි මින් මතු ''දෙපාර්තමේන්තුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවක්, දකුණු පළාතේ පිහිටුවනු ලැබේ.

දෙපාර්තමේන්තු ප්‍රධානියා පත්කිරීම.

3. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන දෙපාර්තමේන්තුව වෙත පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා (මින් මතු ''අධ්‍යක්ෂවරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ යන නාමය හා අභිධානය යටතේ අධ්‍යක්ෂවරයෙකු පත්කරනු ලබන අතර, ඔහු මෙහි 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ද විය යුතු ය. මෙම අධ්‍යක්ෂවරයා ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I වන පන්තියේ නිලධරයෙක් ද විය යුතු ය.

කාර්ය මණ්ඩලය පත්කිරීම

4. (1) දෙපාර්තමේන්තුවේ කාර්යයන් කාර්යක්ෂමව පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයෙකු නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයන් දෙදෙනෙකු, දිස්ත්‍රික්ක සඳහා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරු, කලාප භාරව සහ පුහුණු ආයතන භාරව සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරු ද සහ තාක්ෂණික සේවාවන් සඳහා කෘෂිකර්ම උපදේශකවරුන්, වැඩසටහන් සහකාරවරුන් කෘෂිකර්ම, සංවර්ධන සහකාරවරුන්, - කෘෂිකර්ම සහ අවශ්‍ය වෙනත් කාර්ය මණ්ඩලයක් පත්කිරීමටද බලය ඇත්තේ ය.

(2) මනා කළමනාකරණයක් සඳහා අන්තර් සම්බන්ධතාවයකින් යුතුව කටයුතු කිරීමට රජයේ නිලධාරීන් දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරින් ලෙස පත්කිරීමට අවශ්‍ය වූ අවස්ථාවක අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවය ලබාගෙන පත්කිරීමට බලය ඇත්තේය.

5. අධ්‍යක්ෂවරයා ඇතුළු මෙම ප්‍රඥප්තියේ 4 වන වගන්තිය යටතේ සියලුම පත්කිරීම් සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.

ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම.

6. ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව දෙපාර්තමේන්තතුවේ කාර්යභාරය ඉටුකිරීමට පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමින් ආයතන පිහිටුවිය හැකි ය.

### II කොටස

### දෙපාර්තමේන්තුවේ, අරමුණ, කාර්ය සහ කර්තව්‍ය

දෙපාර්තමේන්තුවේ අරමුණ.

7. දකුණු පළාතේ වගා කළ හැකි සියලුම වගා බිම් කෘෂිකාර්මික බෝග වගාව සඳහා යොමු කරමින් ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කරවීම සහ තිරසාර ආහාර නිෂ්පාදනයන්ට දායක වීම මගින් දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ ප්‍රමුඛ කොටස්කරු වීම දෙපාර්තමේන්තුවේ අරමුණ වේ.

8. දෙපාර්තමේන්තුවේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ. දෙපාර්තමේන්තුවේ කාර්යභාරය.

(අ) කෘෂි කර්මාන්තය ව්‍යාප්ත කිරීමේ කටයුතු සහ ඒ ආශ්‍රිත පුහුණු කටයුතු නිසියාකාරව ඉටුකිරීම ;

(ආ) අමාත්‍යවරයාගේ උපදෙස් මත සිදුකරනු ලබන සියලුම කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම, පසු විපරම් කිරීම සහ එම සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් මධ්‍ය පාලනයට නතු කොට කළමනාකරණය කිරීම ;

(ඇ) පළාතේ ගොවිබිම්වල පස සංරක්ෂණ කටයුතු සම්බන්ධව ක්‍රියාකිරීම සහ පළාතේ විවිධ කෘෂිකාර්මික වගාවන් සම්බන්ධව වන පළිබෝධ හානි සහ වෙනත් දිලීර කාරකයන් මර්දනය කිරීම හා දිලීර කාරකයන් පැතිර යාම වැළැක්වීම සඳහා දැනට පවත්නා කෘෂිකර්ම උපදේශක කාර්යාල පදනම් කොටගෙන අවශ්‍ය අවස්ථාවලදී ඒකක පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ඈ) පළාතේ කෘෂිකාර්මික කටයුතුවල යෙදී සිටින ගොවීන්ට අවශ්‍ය පුහුණුව සහ හුරුව ලබා දීම සඳහා දැනට පවත්නා පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම, පවත්වාගෙන යාම, නූතන තාක්ෂණික දැනුම උපයෝගී කරගනිමින් ඔවුන්ගේ කුසලතා හා නිපුණතා ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම ;

(ඉ) පළාත තුළ කෘෂිකර්ම උපදේශකවරුන්ගේ අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ ග්‍රාමීය කෘෂිකාර්මික සමිති පිහිටුවීම, අධීක්ෂණය කිරීම හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ එම සමිති ලියාපදිංචි කිරීම ;

(ඊ) පළාත තුළ කෘෂිකර්ම ක්ෂේත්‍රයට ස්වේච්ඡාවෙන් සම්බන්ධ වන්නා වූ තරුණ ශ්‍රම දායකත්වය වර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කරවීමට සහ ඊට සම්බන්ධ වන්නා වූ ස්වේච්ඡා තරුණ ගොවි සමාජ ලියාපදිංචි කිරීම, එම සංවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථා සම්පාදනය හා එම සමිති කළමනාකරණය කිරීම ;

(උ) පළාත තුළ ක්‍රියාත්මක වන්නාවූ කෘෂිකාර්මික වැඩසටහන් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය හෝ එහි ලේකම්වරයා විසින් බලය පවරනු ලබන නිලධාරියාගේ අනුමැතියට යටත්ව දෙපාර්තමේන්තුවේ විවිධ තාක්ෂණික මැදිහත්වීම යටතේ ක්‍රියාත්මක කිරීම ;

(ඌ) දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා වගකීම් ඉටුකිරීම පිණිස ලිඛිත නීතියේ සීමාවන්ට යටත්ව දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් ලබා ගත හැකි මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ආධාර ලබා ගැනීම පිණිස කටයුතු කිරීම ;

(එ) දෙපාර්තමේන්තුවේ සේවය කරන කාර්යය මණ්ඩලවලට අවශ්‍ය නූතන දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීම ඇතුළුව අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඒ) දෙපාර්තමේන්තුව විසින් ජනතාවට සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි කිරීම පිණිස එම කාර්යයන් හි නියුතු නිලධරයන් ගේ සේවය ඇගයීම සඳහා කාර්යය සාධන ක්‍රම ඇති කිරීම හා කඩිනම්ව ක්‍රියාත්මක කිරීම ;

(ඔ) පළාතේ කෘෂිකාර්මික කටයුතුවල නියුතු ආයතන හා පුද්ගලයින් සම්බන්ධ තොරතුරු, දත්ත එක් රැස් කිරීම හා තොරතුරු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම ; සහ

(ඕ) ඉහත කාර්යයන් ඉටුකිරීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් කවර හෝ ක්‍රියාමාර්ග ගැනීම.

9. අධ්‍යක්ෂවරයාගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය වනුයේ - අධ්‍යක්ෂවරයාගේ බලතල කාර්යයන් සහ කර්තව්‍ය

(අ) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අරමුණු උදෙසා පැවරෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම ;

(ආ) පළාතට ආවේණික නොවන්නා වූ බෝගයක් හෝ වගාවක් දකුණු පළාත තුළ ස්ථාපිත කිරීමේ දී ඊට අදාළව අනුමැතිය ලබාදීම ;

(ඇ) ප්‍රමාණවත් කාලවේලාවක් ලබා දී පූර්ව දැනුම් දීමකින් පසුව පළාතේ පෞද්ගලික හෝ රාජ්‍ය අංශයේ ඕනෑම ගොවිපලක් පරීක්ෂා කිරීම හෝ එසේ පරීක්ෂා කිරීම සඳහා වෙනත් නිලධාරියෙකුට බලය දීම ;

(ඈ) අලෙවි කිරීම සඳහා යම් ව්‍යවසායකයෙකු කාබනික පොහොර නිෂ්පාදනය කරන්නේ නම් එම පොහොර නිෂ්පාදනවල ප්‍රමිතිය සැලකිල්ලට ගෙන අදාළ ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම ;

(ඉ) කෘෂිකර්ම උපදේශකවරු විසින් කරනු ලබන ලිඛිත නිර්දේශයක් නොමැතිව කෘෂි රසායන අලෙවිසැල් සම්බන්ධයෙන් කෘෂි රසායන අලෙවි කරන අලෙවිසැල් යටතේ කෘෂි රසායන අලෙවි කළ යුතු ක්‍රමවේද සම්බන්ධයෙන් අදාළ විය යුතු නියමයන් කලින් කළ ගැසට් පත්‍රයක් යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන ඒ සඳහා වූ නියමයන් මගින් නියම කිරීම ;

(ඊ) පළාත තුළ සිදුකරනු ලබන සියලුම කෘෂිකාර්මික සංවර්ධන යෝජනා ක්‍රම තීරණය කිරීම ;

(උ) අනිසි බෝග වගාවන් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට හා වාර්තා කිරීමට කෘෂිකර්ම උපදේශකවරුන්ට බලය පැවරී ;

(ඌ) කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම හා එසේ ලියාපදිංචි කරන ලද කෘෂිකර්ම සංවර්ධන ස්වේච්ඡා සංවිධානවල අක්‍රමිකතා හෝ නිශ්චිත අරමුණෙන් බැහැරව හෝ කටයුතු කරන අවස්ථාවල දී, අදාළ සංවිධානවල ලියාපදිංචි අවලංගු කිරීම.

## III කොටස

### කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ස්වේච්ඡා සංවිධාන

කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන පිහිටුවීම.

10. (අ) කෘෂිකාර්මික කටයුතුවල යෙදී සිටින ගොවීන් ඒකාබද්ධ වී කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන පිහිටුවා ගත හැකි අතර එයට ආවේණික වූ නමක් ද පවත්වාගෙන යා හැකි ය.

(ආ) කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන සඳහා වූ පොදු ව්‍යවස්ථාවක් අධ්‍යක්ෂවරයා විසින් සකස් කළ යුතු ය.

(ඇ) මෙම කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් පිහිටුවා ගත හැකි ය.

## IV වන කොටස

### පළාත් උපදේශක කමිටු

පළාත් උපදේශක කමිටුව පිහිටුවීම.

11. (1) අමාත්‍යවරයා විසින් යොමු කරන ලද කෘෂිකර්මයට අදාළ කරුණක් හෝ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීමේ කාර්යය සඳහා උපදේශක කමිටුවක් පිහිටුවිය යුතු ය.

(2) පළාත් උපදේශක කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය.

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයින්,

(i) දකුණු පළාත් අමාත්‍යාංශ ලේකම්,
(ii) දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ විශේෂඥ දැනුම ඇති සහ සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ඒ හා සමාන හෝ ඊට ඉහළ උපාධියක් ලබා ඇති අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් හතර දෙනෙකු හා පළාතේ දිස්ත්‍රික් බල මණ්ඩලයක ධුරයක් දරන ලියාපදිංචි ගොවිජන සංවිධානයක එක් සාමාජිකයෙකු,

(3) ලේකම් උපදේශක කමිටුවේ සභාපතිවරයා වන්නේ ය.

(4) අධ්‍යක්ෂ උපදේශක කමිටුවේ ලේකම්වරයා වන්නේ ය.

(5) ''උපදේශක කමිටු සාමාජිකයින් සඳහා වන පාරිශ්‍රමිකයක්, පළාත් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව අමාත්‍යවරයාගේ අනුමැතිය පරිදි ගෙවිය හැකි ය.''

(6) කමිටුවේ සෑම පත්කළ සාමාජිකයෙකුම මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධූරයෙන් ඉවත් කිරීම නිසා ධූරය හිස් වුවහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු දෙකක කාලයක් ධූරය දැරිය යුතු අතර, ඔහු ධූරයෙන් ඉවත් කරනු ලැබුව හොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතුය.

(7) කමිටුවේ නිලබලයෙන් පත් වූ සෑම සාමාජිකයෙකුම ඔහු කමිටුවේ සාමාජිකයෙකු වූයේ යම් තනතුරක් දැරීම ප්‍රකාරව ද, ඒ තනතුර දරන තාක් කල් ධූරය දැරිය යුතු ය.

(8) යම් පත් කළ සාමාජිකයෙකුම මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීම නිසා ධූරය හිස් කරනු ලබන අවස්ථාවක අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම සඳහා වෙනත් යම් සාමාජිකයෙකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලබන යම් තැනැත්තකු, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

(9) රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා කමිටුවේ සාමාජිකයෙකුට තාවකාලිකව ස්වකීය ධූරයේ කාර්යය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා නොපැමිණෙන කාලය සඳහා එම සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකි ය.

(10) යම් පත් කළ සාමාජිකයෙකු හේතු දක්වා අමාත්‍යවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(11) යම් පත්කළ සාමාජිකයෙකුට ඔහු විසින් ඉල්ලා අස්වන බවට, අමාත්‍යවරයා අමතා ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්විය හැකි ය.

12. (1) උපදේශක කමිටුවේ රැස්වීම මාස දෙකකට වරක් වත් පැවැත්විය යුතු අතර, ඊට අමතරව මේ ප්‍රඥප්තිය යටතේ එහි කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි, රැස්වීම් ඊට වැඩි ගණනක් පැවැත්විය හැකි ය. රැස්වීම්.

(2) උපදේශක කමිටුවේ කවර හෝ රැස්වීමක් සඳහා ගණ පූරණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතු ය.

(3) රැස්වීම් වාර්තාවල පිටපත් සාමාජිකයින්ටත්, අමාත්‍යවරයාටත් ලැබෙන්නට සැලැස්වීම උපදේශක කමිටුවේ ලේකම්වරයාගේ වගකීම වන්නේ ය.

(4) මේ ප්‍රඥප්තියේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, උපදේශක කමිටුවේ රැස්වීම් පිළිබඳ හා ඒ රැස්වීම්වල කටයුතු පිළිබඳ කාර්ය පටිපාටිය කමිටුව විසින්ම විධිමත් කරගනු ලැබිය යුතු ය.

## V වන කොටස

### පොදු විධිවිධාන

13. මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීමේ දී දෙපාර්තමේන්තුව සහ ඒ යටතේ පිහිටු වන ලද ආයතනය විසින් දරන ලද වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් පළාත් සභා අරමුදලින් ලබා දිය යුතු ය. මුදල්

14. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධාරියෙකු විසින් කවර හෝ ආයතනයකින් හෝ පුද්ගලයන්ගෙන් ඕනෑම අවස්ථාවක ප්‍රඥප්තියේ අරමුණට අදාළ වන තොරතුරක් ඉල්ලා සිටිය හැකි අතර, එසේ ඉල්ලා සිටින තොරතුර අධ්‍යක්ෂ වෙත හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධාරියා වෙත සැපයීම අදාළ ආයතනයේ හෝ පුද්ගලයාගේ වගකීම වන්නේ ය. පළාත තුළ කෘෂිකර්මයට අදාළ තොරතුරු ලබාගැනීමේ බලය.

15. (1) වර්ෂයක් තුළ දී පළාත තුළ කෘෂිකර්ම කටයුතු කරගෙන යන ලද ආකාරය, පැන නැගුණු ගැටළු, ඒවා විසඳීමට ගත් පියවර හා කෘෂිකර්ම විෂය ක්‍රියාත්මක වීමට අදාළ වෙනත් කරුණු ගැන සඳහන් කෙරෙන වාර්ෂික පාලන වාර්තාවක් එක් එක් වර්ෂය ඉකුත්ව මාස හතරක කාලයක් ගතවීමට පෙර අධ්‍යක්ෂ විසින් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය. වාර්ෂික පාලන වාර්තාව.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද පාලන වාර්තාව අමාත්‍යවරයා විසින් සාධාරණ කාලයක් තුළ පළාත් සභාවේ සභාගත කළ යුතු ය.

විධාන නිකුත් කිරීමේ බලය.

16. දෙපාර්තමේන්තුවේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් දෙපාර්තමේන්තුවට විශේෂ හෝ සාමාන්‍ය විධාන ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, දෙපාර්තමේන්තුව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුත්තේ ය.

නියෝග.

17. (1) මෙම ප්‍රඥප්තිය යටතේ පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් හා ප්‍රඥප්තියේ අරමුණට අදාළ වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(අ) කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ දී නිෂ්පාදනය කරන්නන් ලියාපදිංචියට අදාළ විය යුතු කොන්දේසි නියම කිරීම.

(ආ) කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීමට අදාළ වන කොන්දේසි නියම කිරීම හා ලියාපදිංචියට අදාළ වන ආකෘති නියම කිරීම.

(ඇ) මෙම ප්‍රඥප්තියේ අරමුණු යටතට ගැනිය හැකි වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන්,

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් ඉදිරි දිනයක හේ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එය යටතට කලින් කරන ලද කිසිවකට අගතියක් නොවන සේ එහි අනුමත නොකළ දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ සේ සලකනු ලබන දිනය *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබිය යුතු ය.

වැරදි හා දඩුවම්.

18. මෙහි පහත සඳහන් කරුණු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේ ය ;

(1) කෘෂිකාර්මික සංවර්ධන කටයුතු සඳහා රජය හෝ පළාත් සභාව විසින් දෙන ලද කෘෂිකාර්මික ආධාර හෝ උපකරණ අයථා ලෙස පරිහරණය කිරීම හෝ අධ්‍යක්ෂවරයාගේ අනුදැනුමකින් තොරව වෙනත් අයෙකුට විකිණීම හෝ පරිහරණය කිරීම.

(2) වගා කටයුතුවල දී අධ්‍යක්ෂවරයා විසින් දෙනු ලබන ලිඛිත නියෝගයකට අනුකූල නොවීම.

(3) යම් නිලධරයෙකු හෝ පුද්ගලයකු විසින් මෙම ප්‍රඥප්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී කවර හෝ නිලධාරියෙකුට බාධා කිරීම.

(4) යම් කෘෂිකර්ම කටයුත්තක දී කෘෂි වගාවකට හෝ ජීව හෝ රසායනික කරුණු මත සිදු වී ඇති හානි ප්‍රාදේශීය මට්ටමින් හෝ ජාතික මට්ටමින් ව්‍යාප්ත වීම වළක්වා ගැනීම පිණිස අධ්‍යක්ෂවරයා හෝ කොට්ඨාස භාර සහකාර අධ්‍යක්ෂවරයා හෝ දෙනු ලබන නියෝග පිළි නොපැදීම.

(5) දකුණු පළාත තුළ වගා වන නීත්‍යානුකූල බෝග වගාවකට හානි වන පරිදි හෝ හානි කිරීමේ අභිලාශයෙන් ආගන්තුක පළිබෝධ හෝ බීජ වර්ග ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම.

(6) (i) අධ්‍යක්ෂවරයාගේ එකඟතාවය නොමැති යම් කෘෂිකාර්මික යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම ;

(ii) මෙම ප්‍රඥප්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු විභාගයකින් පසුව වරදකට වරදකරු වන සෑම තැනැත්තෙකුම රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීම යන දෙයාකාරයකින් එක් ආකාරයකට හෝ එම බන්ධනාගාර ගත කිරීම සහ දඩය යන දෙයාකාරයටම හෝ ඔහු යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය.

19. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

''පළාත් සභාව'' යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාව ද ;
''අමාත්‍යවරයා'' යන්නෙන්, දකුණු පළාතේ කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයා ද ;
''ලේකම්වරයා'' යන්නෙන්, දකුණු පළාතේ කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද ;
''අධ්‍යක්ෂවරයා'' යන්නෙන්, දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ද ;
''කෘෂිකර්ම ඉඩමක්'' යන්නෙන්, කුඹුරු වගා කිරීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි ඉඩම් හෝ කෘෂිකර්මය කළ හැකි පෞද්ගලික ඉඩම් හෝ ඉඩම් සංවර්ධන ආඥාපනත, රජයේ ඉඩම් ආඥාපනත හෝ වෙන යම් පනතක් යටතේ අන්සතු කරනු ලැබූ ඉඩම් ද ;
''අනිසි බෝග'' යන්නෙන් ප්‍රදේශයට නිර්දේශිත නොවන හෝ නීත්‍යානුකූල නොවන හෝ බෝග ද ;
''පලිබෝධ'' යන්නෙන් කෘෂිකාර්මික බෝගයක වර්ධනය අඩාල කරමින් එම බෝගයේ ඵලදාවට හෝ නිරෝගී බවට හානි සිදු කළ ඕනෑම ජීවී විශේෂයක් ද ;
''පළාත'' යන්නෙන් දකුණු පළාත ද අදහස් වේ.

20. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් වේ නම් සිංහල පාඨය ප්‍රමුඛ වේ.

04 - 889

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.